# පාරිසරික ගැටළු අවම කරමින් පරිසර සංරක්ෂණයට බෞද්ධ දර්ශනයෙන් ප්‍රවිෂ්ඨයක්

පී.ආර්.එස්. ලියනාච්චි
සහකාර කථිකාචාර්ය
සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්ව විද්‍යාලය

පරිසරය සජීවීය. එය සම්පතකි. පරිසරය නම් එම සජීවී සම්පත නොතිබුණි නම් මානවයා ද අද නැත. ඒ තරමටම මිනිසා හා පරිසරය අතර ඇත්තේ නොබිඳිය හැකි බැඳීමකි. සබඳතාවයකි. මිනිසා තමා අවට ඇති සියලුම භෞතික අභෞතික දෑ පරිසරය යැයි හඳුනාගන්නා අතර පරිසරය අසීමිතව තම පැවැත්ම උදෙසා ප්‍රයෝජනයට ගනී. පරිසරය නම් සම්පත වුවද ක්ෂය වීම අනිවාර්ය ක්‍රියාවලියකි. ක්ෂය වන්නේ පාරිසරික සම්පත පමණක් දැයි හිත හදාගැනීමට මානවයාට නොහැකිය. මන්ද ඒ සමගම මානවයාගේ ද ඉරණම තීරණය වන බැවිණි. මිනිසා පාරිසරික නිර්මිතයක් බැවින් ක්ෂය වන පරිසරය සුරක්ෂිත කිරීමේ අමිල කාර්යයට මානවයාට අනිවාර්යයෙන්ම මැදිහත් වීමට සිදුවේ. අභාග්‍ය නම් කරුණු එසේ තිබියදී වුවද පරිසරය අසීමිතව බුක්ති විඳින මානවයා පරිසරයට පෙරලා ලබා දෙන දෑම එහි විනාශයට ක්ෂයවීමට හේතුවන අවස්ථා අපට හමුවීමය. එම පරිසරය විනාශය තුළින් පෙරලා මානවයා මුහුණ දෙන පරිසර ගැටළු දිනෙන් දින උග්‍රවීම තුළ මානවයාට පරිසරය හා පරිසර සංරක්ෂණය පිළිබඳව අලුතින් සිතන්නට සිදුවී තිබේ. පරිසර සංරක්ෂණය, තිරසර සංවර්ධනය, ස්වභාවික සම්පත් සංරක්ෂණය ආදී විවිධ මාතෘකා ඔස්සේ පරිසරය සම්බන්ධව නූතනයේ බහුලව සාකච්ඡාවට බඳුන් කෙරේ. කොතෙක් වැඩසටහන්/දැනුවත් කිරීමේ/ව්‍යාපෘති/ සම්මන්ත්‍රණ තුළින් නූතන මානවයා පාරිසරික වැදගත්කම හා එය රැකගැනීම සම්බන්ධව සාකච්ඡා හා විවිධ ක්‍රියාමාර්ගවල අතීතයට වඩා නිරත වුවද මිනිසාගේම අනිටු ක්‍රියාකාරකම් පරිසරයට එරෙහිව පවතී. එබැවින් පරිසර සංරක්ෂණය සම්බන්ධව නව දෘෂ්ඨිකෝණයකින් කරුණු විග්‍රහ කිරීම මෙම ලිපියේ මුඛ්‍ය පරමාර්ථයයි. විශේෂයෙන්ම බෞද්ධ දර්ශනය තුළ පරිසර සංරක්ෂණය සම්බන්ධව පවතින අදහස් පිළිබඳ විග්‍රහයක නිරතවීම මේ තුළින් බලාපොරොත්තු වේ.

## හැඳින්වීම

රතු ඉන්දියානු නායක සියැටැල් 1854 වසරේදී ඇමරිකා එක්සත් ජනපද ජනාධිපතිට යවන ලද ලිපිය පරිසරය සම්බන්ධ වැදගත් කතාවක් අපට කියා දෙන්නකි. බොහෝ පරිසර විද්‍යාඥයින්ගේ ප්‍රසංසාවට හා අවධානයට ලක් වූ එම ලිපිය තුලින් සියැටැල් ලබාදුන් පණිවිඩය පිළිබඳ නැවත නැවතත් සිනාබැලිය යුතු පමණක් නොව වහ වහා ක්‍රියාත්මක විය යුතු කාලයක නූතන මානවයා පසුවන බව අමුතුවෙන් කිවයුතු නැත.

"අපට පූජනීය වස්තුවක් වන මෙම භූමියේ ඇල දොල දිගේ පළිඟු කැට මෙන් දිදුලමින් ගලා බසින ජලය නිකම්ම දිය දහරක් නොව අපේ මුතුන් මිත්තන්ගේ රුධිරය යැයි සියටැල් කීහ. එපමණක් නොව මේ ගංගා අපේ සහෝදරයන්ය. ඔවුහු අපේ පිපාසය සංසිඳුවති. අපේ ඔරුපාරු එහා මෙහා ගෙන යති. අපේ දරුවන් පෝෂණය කරති" වැඩිදුරටත් ප්‍රකාශ කළ ඔහු මිනිසා මහ පොළොවට අයිති වුවත් මහ පොළව මිනිසාට අයිති නොවන බවද ඒ ලිපියෙන් ප්‍රකාශ කර ඇත. අප මෙම මිහිතලයේ, පරිසරයේ භාරකරුවන් පමණක් වන හෙයින් පරිසරය කෙලසීමට වරම අපට නැත. පරිසරය අපේ මුතුන් මිත්තන් සුරක්ෂිතව දායාද කොට දුන්නා සේම අපද අපේ අනාගත පරපුරට එය සුරක්ෂිතව උරුම කොටදිය යුතුය.

උක්ත ප්‍රකාශයෙන් සියැටැල්. 1854 දී හෙළිදරව් කළ අදහස වර්තමානයේ අපට විමසීමට සිදුවන්නේ අභාග්‍ය සම්පන්න පාරිසරික පසුබිමක් තුළදීය. පාරිසරික දායාද අපේ සහෝදර සහෝදරියන් ලෙස ලේ බැඳීමකට සියැටැල් සමාන කළ ද අප ඒ ලේ බැඳීම පලුදු කර හමාරය.

පරිසරය සුරක්ෂිත කිරීම හා පරිසරයේ වැදගත්කම පිළිබඳව අප සාකච්ඡා කළහොත් ප්‍රථමයෙන්ම මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍යය ජීවී සහයක සේවාවන් (Life Support Services) රැසක් පරිසරය මගින් සපයා දේ. එපමණක් ද නොව මිනිස් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍යය හා ශක්තිය ලබාදීම ද පරිසරය හා මානවයා අතර අන්තර් සබඳතාව ශක්තිමත් කරන පාරිසරික කාර්යභාරයකි. එම අමුද්‍රව්‍ය හා ශක්තිය අතර මිනිසාගේ ආර්ථික ක්‍රියාවලියට අවශ්‍ය ශක්තිය සපයන සූර්ය බලය, පොසිල හා ජෛව ඉන්ධන, සුළඟ, භූ තාපය, ජල විදුලිය වැනි ශක්ති ප්‍රභවයන් ද පරිසරයෙන් ලබාදෙන විවිධ ලෝහ රසායනික ද්‍රව්‍ය හා ඛණිජ වැලි වැනි දෑ මත්ස්‍ය සම්පත හා විවිධ වන සම්පත් ජෛවීය අමුද්‍රව්‍යයන් වේ. එසේම පරිසරයේ පවතින අපද්‍රව්‍ය අවශෝෂණය කිරීමේ ගුණය එනම්, ජීව ක්‍රියාවලිය හා ආර්ථික ක්‍රියාවලිය තුළින් මානවයා නිපදවන අපද්‍රව්‍ය පරිසරයට අවශෝෂණය කරගනී, උදාහරණ ලෙස, මිනිසා හා සතුන් නිපදවන කාබන්ඩයොක්සයිඩ් වායුව පරිසරයේම ඇති සංඝටකයක් වන ශාඛා මගින් අවශෝෂණය කරගැනීම දැක්විය හැකිය. (අබේවර්ධන,2002) මෙබඳු විශාල කර්තව්‍යයක් පරිසරය හා මානවයා අතර අන්තර් සබඳතාව ශක්තිමත් කරනු වස් පරිසරය පැත්තෙන් ඉටුවන බව පෙන්වා දිය හැකිය. නමුත් පරිසරයේ ඇති මෙම

හැකියාවට සීමාවක් පවතින අතර අපද්‍රව්‍යය නිපදවීමේ සීඝ්‍රතාවය පරිසරයේ අවශෝෂණ ධාරිතාවය ඉක්මවා යාමෙන් මෙම තුලනය බිඳවැටිය හැකි බව පරිසර විද්‍යාඥයන්ගේ මතය වනවා සේම ප්‍රායෝගික සත්‍යයක් බවටත් එය වත්මන්හි පත්ව තිබේ.

හුදෙක්ම මිනිසා ජීවීන් අතර උසස්ම ජීවියා වශයෙන් පරිසරය භුක්ති විඳීමේදී දැනුවත්ව හෝ නොදැනුවත්ම ඔහු අතින් පෙරලා සිදුවූ ක්‍රියාකාරකම් පරිසරය දූෂණය, වන විනාශය, ජල දූෂණය, වායු දූෂණය, පාංශුඛාදනය ආදී සියලු කරුණු හරහා හෙළිකරන්නේ උක්ත පාරිසරික ගැටළුවයි. පාරිසරික සංරක්ෂණය, වන සංරක්ෂණය, ජල අර්පිරිමැස්ම, ඕසෝන් වියන රැකගැනීම, තිරසර සංවර්ධනය ආදී මාතෘකා ඉදිරියට පැමිණෙමින් අප යලි යලිත් සාකච්ඡාවට ලක්කරන්නේ පරිසර ගැටළුවට පිළියම් සොයන ආකාරයයි. විශේෂයෙන් චාල්ස්, හෝටන් කූලී (C.H. Cooley) පවසන පරිදි පරිසර ගැටළුව යනු, හිම බෝලයක් වැනි දෙයකි. එය පෙරලෙන්නට ගත්විට වේගයෙන් පෙරලේ. (සුධම්ම හිමි,2001) ඒ ප්‍රකාශයෙන්ම පරිසර ගැටළුව අපට හඳුනාගත හැකි වේ.

විශේෂයෙන්ම පරිසර විද්‍යාඥවරියක වූ "රේචල් කාසන්" මෙනවිය "නිහඬ වසන්තය" (Silent Spring -Rachel Carson) නමින් ග්‍රන්ථයක් 1962 වසරේදී පලකරන ලදී. උද්ගත වෙමින් පැවති පාරිසරික ගැටළුව පිළිබඳව අන්තර්ජාතික අවධානය දිනාගැනීමට සමත් වූ එම ග්‍රන්ථය පළ කිරීමෙන් ඇය අදහස් කළේ සීඝ්‍රයෙන් පැතිරයමින් තිබූ දරුණු රසායනික භාවිතයෙන් මිනිසාටත් අනෙක් ජීවීන්ටත් අත්විය හැකි අනපේක්ෂිත විපත පිළිබඳ ලෝකයාගේ අවධානය යොමු කිරීමය. ඇය ඒ සඳහා යොදාගත්තේ කල්පිත නගරයක වැසියන්ට විෂ ද්‍රව්‍යයක් හේතුවෙන් අත් වූ ඛේදවාචකයක් නිරූපණය කිරීමය. සියුම් තුඩු විශේෂයක් හිම වැස්සක් මෙන් පතිත වීම හරහා එම ප්‍රදේශයේ සතුන් හා මිනිසුන් ක්‍රමයෙන් රෝගාතුරව මියයාම කාසන් මෙනවිය ඉන් ඉදිරිපත් කරන ලදී. ඇය මෙම කෘතිය තුලින් ඉදිරිපත් කළ මෙම කල්පිත සිදුවීම වසර 14 ක් වැනි කෙටි කාලයකින්ම සත්‍ය අනාවැකියක් බවට පත්වූයේ 1976 වසරේදී ඉතාලියේ මිලාන් නගරය අසල සිවෙසෝ (Seveso) නගරයේ පිහිටි රසායනික කම්හලකින් සිදුවූ විෂ වායු කාන්දුවීමේ විපතයි. ඉන් ගෘහ ආශ්‍රිත සතුන් 81,000 කට මරණය අත්විය. 37,000 ට පමණ වූ ප්‍රදේශවාසීන්ට ඩයොක්සීන් විෂ වායුව හේතුවෙන් නොයෙක් විපත් අත්කර දුනි.

ඒ කරුණු විමසා බැලීම තුලින් වර්තමානයේ ලෝකය හමුවේ ඇති පරිසර ගැටළුවේ තරම හඳුනාගත හැකිවනු ඇත. ඒ කෙසේ වෙතත් පරිසර ගැටළු විසඳා ගැනීමටත්, සම්පත් සංරක්ෂණය සඳහාත් වැඩි වැඩියෙන් සාකච්ඡා කෙරෙන හා විවිධ ක්‍රියාමාර්ග අලුතින් සිතන යුගයක පරිසර සංරක්ෂණය හා පරිසර ගැටළු මුලුමනින්ම විසඳා ගැනීමට නොවුනත් යම්තාක් දුරකට අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව වෙනත් දෘෂ්ඨී කෝණයකින් කරුණු විග්‍රහ කිරීම මෙහිදී වැදගත් වේ. මන්ද කොතරම් පිළියම් සැපයුවද අප තවමත් සිටින්නේ පරිසර ගැටළුවේ අඩියේම වන බැවිනි.

හුදෙක්ම බෞද්ධ දර්ශනය යනු මිනිසාගේ මෙලොව පරලොව යන දෙපක්ෂයේම සුබ විහරණය සඳහා ගැඹුරු අදහස් මාලාවක් අඩංගු දර්ශනයකි. මානව ක්‍රියාකරකම් යහපත්ව පවත්වා ගැනීම තුළින් මානවයාගේ බාහිර හා අභ්‍යන්තරික පරිසරය යහපත්ව පවත්වා ගත හැකි බව බෞද්ධ මතයයි. විශේෂයෙන්ම මානවයාගෙන් තොර පරිසරයකුත් පරිසරයෙන් තොර මානවයකුත් නැත. පරිසරයට මානව ක්‍රියාකාරකම් ප්‍රබලව බලපාන්නා සේම මානවයාගේ පැවැත්ම කෙරෙහි පෙරලා පරිසරය බලපෑම් කරන බව බෞද්ධ දාර්ශනික ආකල්පයයි. එබැවින් පරිසරය හා මිනිසා අතර ඇති වෙන්කළ නොහැකි බැඳීම සුරක්ෂිත කරගන්නේ කෙසේද යන්න බෞද්ධ දර්ශනය තුළින් විමර්ශනය කර බැලීම මෙහිදී වැදගත් වනු ඇත.

## පරිසර සංරක්ෂණය සම්බන්ධ බෞද්ධ ආකල්පය

අප ඉහතින් ඉදිරිපත් කළ කරුණු අනුව පරිසර ගැටළුවට කඩිනම් පිළිතුරු සැපයීමේ අවශ්‍යතාව අවධාරණය වනවා සේම පරිසර ගැටළුව පිළිබඳ වෙනත් දෘෂ්ඨී කෝණයකින් සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවය ද ඉස්මතු වේ. මේ අනුව පරිසරය සම්බන්ධව බෞද්ධ දර්ශනය තුළ ඇති මතවාදයන් මගින් පරිසර සංරක්ෂණයට යම් වැඩපිළිවෙලක් සකසා ගැනීමට හැකි ද යන්න සොයා බැලීමට හැකියාව ලැබේ.



බුදුන් වහන්සේ බොහෝ අවස්ථාවල දිවා විවරණය ලබාගෙන ඇත්තේ ද පිරිසිදු වාතාශ්‍රය ඇති වෘක්ෂ මූලයක සිටය. මහ රහතන් වහන්සේලාට භාවනායෝගීව සිටීමට ද වනාන්තර පෙදෙස ඉතාමත් යෝග්‍ය බව බුදු දහමේ හඳුන්වා ඇත.

විශේෂයෙන්ම බුදු දහමේ මිනිසාට භෞතික පරිසරය හා සිය ආධ්‍යාත්මික පරිසරය යහපත්ව පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කොට තිබේ. සරලව ගතහොත් සුදුසු පෙදෙසක වාසය කිරීම (පතිරූප දේස වාසෝච) මංගල කරුණක් වශයෙන් බුදුන් මංගල සූත්‍රයේදී අනුදැන වදාරා තිබීමෙන්ම යහපත් පරිසරයක වැදගත්කම බෞද්ධ දර්ශනය අනුමත කර ඇති බව පසක් කර ගත හැකිවේ.

විශේෂයෙන්ම බුද්ධ චරිතය මැනවින් විමර්ශනය කිරීමේදී ද පරිසරය සමඟ පැවැත් වූ අන්තර් සම්බන්ධතාව වටහාගත හැකිය. බුදුන් වහන්සේගේ චරිතයේ වැදගත් සිදුවීම් වූ ඉපදීම, බුදු වීම, පිරිනිවන් පෑම යන සිදුවීම් 03 සිදුවී ඇත්තේ පරිසරය මුල් කරගෙනය. බුදුන් වහන්සේ බොහෝ අවස්ථාවල දිවා විවරණය (දහවල් ආහාරය) ලබාගෙන ඇත්තේ ද පිරිසිදු වාතාශ්‍රය ඇති වෘක්ෂ මූලයක සිටය. මහරහතන් වහන්සේලාට භාවනා යෝගීව සිටීමට ද වනාන්තර පෙදෙස ඉතාමත් යෝග්‍යය බව බුදු දහමේ හඳුන්වා ඇත.

මිනිසා තුළ ඇති ආශාව, තෘෂ්ණාව වර්ධනය වීම හේතු කොටගෙන අධිකව පරිසරය ප්‍රයෝජනයට ගැනීම නිසා මිනිසා හා පරිසරය අතර අන්තර් සබඳතාව බිඳී පරිසර අසමතුලිතතාවයක් ඇතිවීමේ ප්‍රතිඵලයක් ලෙස පරිසර ගැටළුව උද්ගත වන බව බෞද්ධ අදහසයි. එය බුදුන් වහන්සේ පටිච්ච සමුප්පාදයේ පැහැදිලි කර දී තිබේ.

- අ. ඇතිවිට ආ. ඇති වේ.
- අ. ඉපදීමෙන් ආ. උපදියි.
- අ. නැතිවිට ආ. ද නැත.
- අ. නැතිවීමෙන් ආ. නැතිවෙයි.

මෙය පරිසරයට ආදේශ කළ විට,

- මිනිසා. ඇතිවිට .පරිසරය. ඇතිවේ.
- මිනිසා. ඉපදීමෙන් .පරිසරය. උපදියි.
- මිනිසා. නැතිවිට .පරිසරය. ද නැත.
- මිනිසා. නැතිවීමෙන් .පරිසරය. ද නැති වෙයි.

(සුධම්ම හිමි,2001)

මේ තුළින් මිනිස් ක්‍රියාකාරකම් පරිසරය සඳහා බලපාන ආකාරය හඳුනාගත හැකිවේ. පරිසරය සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ආකල්පය බෞද්ධ දේශනා තුළ ඇති බොහෝ සූත්‍ර දේශන තුළින් හෙළි කරගත හැකිය. මිනිසා විසින් පරිසරය පරිහරණය කිරීමේදී පරිසරයට වන හානි අවම කරගනිමින් එය ක්‍රියාත්මක කළ යුතු බව බුදු දහම අනුදැන වදාරා ඇති වුවත් පරිසරය පරිහරණය නොකළ යුත්තක් බව බුදුදහමේ කිසිසේත්ම සඳහන් නොවේ. නුවණැත්තා තම ආත්මය දමනය කරගන්නා සේම යහපත් පුද්ගලයා පරිසරය පරිහරණය කළ යුත්තේ නුවණින් යුක්තවයි. (තලංගල්ලේ සුධම්ම හිමි)

එසේ පරිසරය පරිහරණය කළයුතු අන්දම පිළිබඳව උචිත උපමාවන් සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇත. මේ තත්ත්වය වඩාත් සවිස්තරාත්මකව දැක්වුවහොත් යම් සේ බඹරා මලේ වර්ණයට ද මලේ සුවඳට ද හානියක් සිදු නොකර මල් පැණි ගෙන යයිද එසේම බඹරා ශාකයෙහි වර්ධනයට අවශ්‍ය කරන පරාග පෝෂණය කරයි. එබැවින් මල නොතලා රොන් ගැනීම ලෙස බුදුදහම මඟින් පෙන්වා දී ඇත්තේ මෙම කරුණයි. පරිසරයේ සම්පත් තිබූ පමණටම ඒවා ප්‍රයෝජනයට නොගෙන තමන්ට අවශ්‍ය ප්‍රමාණය පමණක් ඉන් ලබාගැනීම ද බුදු දහමේ ඉගැන්වීමයි. එනම්, පරිසරය සාහසිකව ප්‍රයෝජනයට ගැනීම වරදක් බව උදුම්බරඛාදක උපමාව තුළින් දීඝජානු කෝලිය සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කර තිබේ.

"දිවුල් කෑමට කැමති පුද්ගලයා ගසේ අතු සොලවයි. එවිට පැසුණු ගෙඩි පමණක් නොව ගැට මල් අතු ද කඩා වැටේ. නමුත් ඔහු ප්‍රයෝජනයට ගන්නේ ඉදුණු ගෙඩි පමණකි." එබැවින් මෙබදු විනාශකාරී පරිසර පරිහරනයට බුදු දහමේ ඉඩක් නොමැති බව එම උපමාවෙන් හඳුනාගත හැකිය.


එපමණක් නොව බුදුන් වහන්සේ තම සංඝයාට පැනවූ විනය ප්‍රඥප්ති තුළ ද පරිසර සංරක්ෂණය සම්බන්ධව නිදසුන් සපයා ගතහැකිය. විශේෂයෙන්ම භික්ෂු චීවරය ගත්විට මළමිනී වසා දමන වස්ත්‍ර වේ. එම චීවරයේ වර්ණ ගන්වා ගන්නේ ශාක ආශ්‍රයෙන් නිර්මාණය කරගන්නා ලද ද්‍රව්‍ය මඟිනි. එසේම බුදුන් වහන්සේ අනුදැන වදාල ද්‍රව්‍ය වර්ග 06ක් වේ.



එනම් ශාඛ මුල්, දඬු, පොතු, කොළ සහ ගෙඩි ආදිය වේ. පරිසර සංරක්ෂණය සඳහා මෙය බෙහෙවින් වැදගත් වේ. විශේෂයෙන්ම නූතන තත්ත්වය ගත්විට කෘතිම වර්ණ සංයෝග හේතුවෙන් ප්‍රබල පරිසරික ගැටළු පැනගනින බව තේරුම් ගැනීම අපහසු නැත.

පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් වැදගත් වූ දේශනාවන් විනය තුළින් හෙලිවේ. “භික්ෂු පුරුෂයිනි, තෙපි රුක් සිඳිමත්, සිඳවීමක් කළාහුද? භික් පුරුෂයිනි, මිනිසුන් රුක් ජීවය අතැයි යන හැඟීම ඇතියෝයි සිතති. එබැවින් වෘක්ෂලතා සිඳලීම නොකළ යුතුය.” එය පාචිත්ති ඇවතක් බව ද දක්වා තිබේ.

විශේෂයෙන්ම බුදුන් වහන්සේ වැසි සමයෙහි වස් විසීම අනුදැන වදාරා ඇත්තේ ද උක්ත කරුණ මතු කරමිනි. මන්ද වැසි සමයෙහි අලුතින් දළු ලන තෘණ වර්ග මල් මෙන්ම සතුන් ද භික්ෂු චාරිකාවේ යෙදීමෙන් විනාශ වීම වැලැක්වීම එහි අරමුණ වී තිබේ. ජල සංරක්ෂණයට ද බුදු සමයෙහි වැඩි වැදගත්කමක් දී ඇති ආකාරය හඳුනාගත හැකිය. බුදුන් ජල සංරක්ෂණය සඳහා නීති පනවා තිබේ. නිරෝගී භික්ෂුවක් ජලයෙහි මළ මුත්‍ර හෝ කෙළ ගැසීම “අකුලා ඇවතක්” වේ. භික්ෂු වහන්සේලා විසින් සෙනසුන් පවිත්‍ර කිරීමේදී ද දූවිලි අංශු ජලයට එක් නොවන ලෙස කිරීමට බුදුන් නීති පනවා ඇත. බොනදිය සමීපයෙහි සෙනසුන් ගසා නොදැමිය යුතු යැයි කීවේ ඒ නිසාය. විශේෂයෙන්ම බුදුන් වහන්සේ ප්‍රාණඝාතය සිදු නොකළ යුතු යැයි ශික්ෂාවන් පනවනවා ඇත්තේ ද, සත්ත්ව සම්පත ආරක්ෂා කිරීම පිණිසය.



බුදුදහම තුළ පරිසරය හා පරිසර සංරක්ෂණය පිළිබඳ ගැඹුරු දර්ශනයක් අඩංගු වේ.

ඒ අනුව බුදු දහමේ වන සංරක්ෂණය, වායු සංරක්ෂණය, ජල සංරක්ෂණය, ශබ්ද සංරක්ෂණය, සත්ත්ව සංරක්ෂණය, ආදී පරිසරයේ සියලුම අංගයෙන් ආරක්ෂා කිරීමේ වැදගත්කම සිය දේශනා තුළින් වඩාත් අවධාරණය කර ඇති බව හඳුනාගත හැකිය. හුදෙක්ම මිනිසා තෘෂ්ණාවෙන් ඇලී මමය, මාගේය, යන හැඟීමෙන් වඩවඩාත් කටයුතු කිරීම තුළ පරිසරය පමණක් නොව තමාගේ ද විනාශය සිදුවන බව බුදුන් අනුදැන වදාරා, තිබේ. එබැවින් රාගයෙන්, ද්වේශයෙන්,ඇලීමෙන් මිදුණු කළ පරිසරය වඩාත් යහපත් තැනකට ගමන් කරන බව බුදුදහම තුළ ඇති අදහස් සමස්ථයක් වශයෙන් ගෙන බලන කළ හඳුනාගත හැකිය.



බෞද්ධයින්ගේ වන්දනාමානයට ලක් වන බෝධි වෘක්ෂය

## නිගමන

- බුදු දහම තුළ පරිසරය හා පරිසර සංරක්ෂණය පිළිබඳ ගැඹුරු දර්ශනයක් අඩංගු වේ.
- බුදු දහම පුද්ගල කේන්ද්‍රීය පරිසර සංරක්ෂණයක් අනු දැන වදාරා ඇත.
- ජීවි වස්තු පමණක් නොව පරිසරයේ අජීවි යැයි නූතන ලෝකයේ හඳුනාගන්නා අංග ද සංරක්ෂණය කළ යුතු බව බෞද්ධ අදහසයි.
- බුදු දහමට අනුව පරිසරය හා මානවයා අතර ඇත්තේ වෙන් කළ නොහැකි බැඳීමකි.

## යෝජනා

- බෞද්ධ දර්ශනය තුළ ඇති පරිසරය සංරක්ෂණ වැඩ පිළිවෙලවල් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක නිරත වීම.
- එම අදහස් පරිසර සංරක්ෂණය සම්බන්ධ නූතන මතය සමඟ ගලපා ගැනීම
- බෞද්ධ දර්ශනය තුළ ඇති පරිසර සංරක්ෂණ වැඩ පිළිවෙල දෛනිකව ක්‍රියාවට නැගීම.
- බෞද්ධ ධර්ම දේශනා තුළට පරිසරය සම්බන්ධ බෞද්ධ අදහස් එක් කරමින් එම අදහස් සමාජයට සම්ප්‍රේෂණය කිරීම.



විශේෂයෙන්ම බුදුන් වහන්සේ වැසි සමයෙහි වස් විසීම අනුදැන වදාරා ඇත. මන්ද වැසි සමයෙහි අලුතින් දළු ලන තෘණ වර්ග මල් මෙන්ම සතුන්ද භික්ෂු චාරිකාවේ යෙදීමෙන් විනාශ වීම වැළැක්වීම එහි අරමුණයි

## ආශ්‍රිත ග්‍රන්ථ


01. අබේගුණවර්ධන පියසේන, අතුල සේනාරත්නඃ2002, ස්වභාවික සම්පත් සහ පරිසර ආර්ථික විද්‍යාව, කතෘ ප්‍රකාශන.

02. තලංගල්ලේ සුධම්ම හිමිඃ2001, පරිසර ගැටළුව සහ පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ආකල්පය, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

03. පතිරණ ශ්‍රු.වී.එස්ඃ 2006, පරිසර සැරිසර සොබා සුන්දරත්වය විඳින්ට අත්වැලක්, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ.

04. රත්නපාල ජී.ඇම්ඃ 2002, අපේ පරිසරය හා ලෝකයේ අනාගතය? දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන.

05. සඳපාල අමරසේන : 1999, ගෝලීය පරිසර අර්බුදය, කතෘ ප්‍රකාශන.

06. සපරමාදු එස්.ඩීඃ 2007, ශ්‍රී ලංකා වන ජීවීන් අතර, දෙහිවල, තිසර ප්‍රකාශකයෝ.

07. සමරසිංහ විමලදාස : 1989, සජීවී පරිසරය, කොළඹ 08, පහන් ප්‍රකාශන.

01. Arvill Robert: 1967, Man and Environment, New York, Penghin Books P.t.d.

02. Rajagopalan.R: 2005, Environmental Studies, India, Oxford University Press